00151

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**BACHELOR OF MANAGEMENT STUDIES DEGREE PROGRAMME**
**LEVEL-5**
**FINAL EXAMINATION – FEBRUARY 2010**
**MCU 3205 – RESEARCH METHODOLOGY**
**DURATION : THREE (03) HOURS**

THE LIBRARY OPEN UNIVERSITY OF SRI LANKA

---

**DATE : 06.02.2010** **TIME : 1.30 P.M. – 4.30 P.M.**

---

**IMPORTANT INSTRUCTIONS:**

- **ANSWER ANY FIVE (05) QUESTIONS.**

**ALL THE QUESTIONS CARRY EQUAL MARKS.**

1. Research contributes to managerial problem solving and decision making. Do you agree with this statement? Express your views highlighting the relationship between research and management problems. Use suitable examples.

(20 Marks)

2. a) What is meant by research design. Explain briefly.

(08 Marks)

b) Distinguish the difference between the Social Survey Method and Case Study method in carrying out research. Use examples to elaborate your answer.

(12 Marks)

3. a) Explain the factors that have to be considered in defining a research problem

(08 Marks)

b) Assume that you have been assigned a task of identifying a research problem prevails in your work organization or any other organization known to you. Describe the problem you have identified and conceptualize it. Your answer should include the major components of the conceptualization process.

(12Marks)

4. a) Describe the key components of a research proposal.

(08 Marks)

b) Prepare a research proposal to carry out a research in relation to a management problem prevailed in an organization. You are free to make any reasonable and realistic assumptions on this issue.

(12 Marks)

5. a) Explain briefly the important factors to be taken into account in developing a questionnaire, that could be effectively used to collect data from a larger sample selected.

(06 Marks)

b) Do you think that conducting a pilot survey is required before administering a questionnaire to a selected sample or to the total population? Discuss

(06 Marks)

c) Some researchers use Observation Method to collect primary data. Express your views about the adequacy of this method in collecting data relating to management research.
(08Marks)

6. a) Briefly explain the different types of measurement scales used in data analysis.
(12 Marks)

b) Discuss the importance of identifying the measurement scales in data analysis.
(08 Marks)

7. Write short notes on following;

I. Independent and dependent Variables
II Convenient Sampling Method
III Primary and Secondary Data
IV Lickert Scale

(20 Marks)

-Copy Rights Reserved-

00151

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන උපාධි වැඩ සටහන - පස් වන මට්ටම
අවසාන පරීක්ෂණය - **2010** පෙබරවාරි
**MCU 3205** – පර්යේෂණ ක්‍රමවේදය
කාලය - පැය තුනයි **(03)**

දිනය - **2010.02.06** වේලාව - ප. ව. **1.30** – ප. ව. **4.30**

උපදෙස් :–
ඕනෑම ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

1. කළමනාකාරිත්ව ගැටලු විසඳීමට හා තීරණ ගැනීමට පර්යේෂණ දායක වේ. ඔබ මෙම ප්‍රකාශය හා එකඟ වන්නේද? පර්යේෂණ සහ කළමනාකාරිත්ව ගැටලු අතර පවත්නා සම්බන්ධතාවය විදහා දක්වමින් ඔබගේ අදහස් ප්‍රකාශ කරන්න. සුදුසු උදාහරණ යොදා ගන්න. (ලකුණු 20)

2. අ පර්යේෂණ නිර්මාණයක් (Research Design) යන්නෙන් කුමක් අදහස් කෙරේද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 8)

ආ පර්යේෂණ සිදු කිරීමේදී යොදා ගනු ලබන සමාජ සමීක්ෂණ ක්‍රමය (Social Survey Method) සහ සිද්ධි අධ්‍යයන ක්‍රමය (Case Study Method) අතර වෙනස දක්වන්න. ඔබගේ පිළිතුර පැහැදිලි කිරීම සඳහා උදාහරණ යොදා ගන්න. (ලකුණු 12)

3. අ පර්යේෂණ ගැටලුවක් නිර්වචනය කිරීමේදී සලකා බැලිය යුතු වන කරුණු. පැහැදිලි කරන්න. (ලකුණු 8)

ආ ඔබගේ සේවා ආයතනයේ හෝ ඔබ දන්නා වෙනත් සංවිධානයක පවත්නා පර්යේෂණ ගැටලුවක් හඳුනා ගැනීමේ කාර්ය ඔබ වෙත පවරා ඇතැයි උපකල්පනය කරන්න. ඔබ හඳුනාගත් ගැටලුව පැහැදිලි කර එය සංකල්පීකරණය කර දක්වන්න. ඔබගේ පිළිතුරට ගැටලුවක් සංකල්පීරණය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අංග ඇතුළත් විය යුතුය. (ලකුණු 12)

4. අ පර්යේෂණ යෝජනාවක තිබිය යුතු මූලිකාංග විස්තර කරන්න. (ලකුණු 8)

ආ සංවිධානයක පැවතිය හැකි කළමනාකරණ ගැටලුවකට අදාළව පර්යේෂණයක් සිදු කිරීම සඳහා පර්යේෂණ යෝජනාවක් පිළියෙල කරන්න පිළිගත හැකි හා සාධාරණ උපකල්පනයන් මේ සඳහා ඔබට යොදා ගත හැක. (ලකුණු 12)

5. අ විශාල ප්‍රමාණයේ නියැදියකින් දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලියක් ගොඩනැගීමේදී සැලකිය යුතු වන වැදගත් කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

00151

ආ සමස්ථ සංගණනයම හෝ තෝරා ගනු ලැබූ නියැදියකට ප්‍රශ්නාවලියක් යොමු කිරීමට පෙර නියමු සමීක්ෂණයක් ( Pilot Survey) සිදු කිරීම අවශ්‍ය යයි ඔබ සිතන්නේද? සාකච්ඡා කරන්න.

(ලකුණු 6 )

ඇ ඇතැම් පර්යේෂකයින් ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා නිරීක්ෂණ ක්‍රමය (Observation Method) යොදා ගනු ලබයි. කළමනාකරණ පර්යේෂණයන් සඳහා දත්ත රැස්කිරීමේදී මෙම ක්‍රමයේ ප්‍රමාණවත්බව පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.

(ලකුණු 8 )

6. අ දත්ත විශ්ලේෂණයේදී යොදා ගනු ලබන විවිධ මිනුම් ක්‍රම හා පරිමාණයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු12 )

ආ දත්ත විශ්ලේෂණයේදී මිනුම් පරිමාණයන් හඳුනා ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 8 )

7. පහත දැක්වෙන දෑ පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i ස්වායත්ත හා පරායත්ත විචල්‍යයන්

ii පහසු නියැදීම් ක්‍රමය

iii ප්‍රාථමික හා ද්විතියික දත්ත

iv ලිකර්ට් පරිමාණ ක්‍රමය

(ලකුණු 20 )

THE OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

- හිමිකම් ඇවිරිණි -